මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PRE/2024/78** **2024.09.13**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

### ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීමට අදාළව ප්‍රචාරය වන වගකීමෙන් තොර ප්‍රවෘත්ති සම්බන්ධ පැහැදිළි කිරීම

ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීම නිදහස්, සාධාරණ හා විශ්වසනීයභාවයෙන් යුතුව පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් මේ වන විට සියලු විධිවිධාන යොදා ඇත.

එයට අදාළව මැතිවරණ කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිතව කළ යුතු කාර්යයන් පිළිබඳ චක්‍රලේඛ, උපදෙස්, නියෝග නිකුත් කොට ඇති අතර ඒ සම්බන්ධයෙන් ජනමාධ්‍ය හරහා මහජනතාවද දැනුම්වත් කොට ඇත.

එසේ වුවද වර්තමාන මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස්වලට පරිබාහිරව විවිධ පුද්ගලයන් හා සංවිධාන විසින් ඡන්ද විමසීම් ක්‍රියාවලියට අදාළව එනම් ඡන්දය සලකුණු කරන ආකාරය, ඡන්ද හා මනාප ගණන් කරන ආකාරය, මැතිවරණ නීති බලාත්මක කිරීම, ප්‍රචාරණ කටයුතු හා වෙනත් පරිපාලනමය කාර්යයන් සම්බන්ධයෙන් වරින් වර කරනු ලබන ප්‍රකාශ හා මත මාධ්‍ය මඟින් ප්‍රචාරය වන බව නිරීක්ෂණය වන අතර ඒවා මැතිවරණ කොමිෂන් සභාවේ නිල නිවේදන නොවන බවත්, එවැනි කිසිදු ප්‍රකාශයක නිල වලංගුතාවක් නොමැති බවත් ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ වගකීමක් නොමැති බවත් නිවේදනය කරනු ලැබේ. ඡන්ද විමසීම් ක්‍රියාවලියට අදාළ කරුණක් පිළිබඳව ඕනෑම පුරවැසියෙකුට මැතිවරණ කොමිෂන් සභාව විමසා කරුණු පැහැදිලි කරගැනීමේ අවස්ථා පවතී.

මෙම ඡන්ද විමසීමේ දී මහජනතාව දැනුම්වත් කළ යුතු සියලු කරුණු සහ කාර්යයන් සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව නිල වශයෙන් දැනුම් දීම් කරනු ලබන හෙයින් වෙනත් පුද්ගලයින් හා සංවිධාන විසින් කරනු ලබන ප්‍රකාශ, මත හා දැනුම්වත් කිරීම් නොසලකා හරින මෙන් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන්)